1. X සමබර දාදු කැට දෙකක් විසි කිරීමේදී ලැබෙන අගයන්ගේ උපරිම අගය ලෙස සළකා X හි සම්භාවිතා ව්‍යාප්තිය ගොඩනංවන්න.

2. ව්‍යාපාරයකින් රු. 10,000ක් ලාභ ලැබීමට 0.1ක සම්භාවිතාවක් ද, රු. 5,000ක් ලාභ ලැබීමට 0.4ක සම්භාවතාවක් ද රු. 1,000ක් පාඩු ලැබීමට 0.5ක සම්භාවිතාවක් ද පවතී නම්, ව්‍යාපාරයේ ලාභය හෝ පාඩුව X ලෙස සලකා සම්භාවිතා ව්‍යාප්තිය ගොඩනංවා අපේක්ෂිත අගය හා විචලතාවය සොයන්න.

3. කම්හලක නිපදවන භාණ්ඩවලින් 30%ක් දෝෂ සහිත වේ. අහඹු ලෙස තෝරා ගත් භාණ්ඩ 10ක් පරීක්ෂා කිරීමේදී සදොස් භාණ්ඩ ගණන,

අ) හරියටම 2ක් වීමේ සම්භාවිතාව

ආ) 7කට වඩා වැඩි ගණනක් වීමේ සම්භාවිතාව

ඇ) 8කට වඩා අඩු ගණනක් වීමේ සම්භාවිතාව

4. බැංකුවක මුදල් කවුන්ටරයක් වෙත සසම්භාවී ලෙස ගනුදෙනුකරුවන් පැමිණීමේ සාමාන්‍යය මිනිත්තුවකට 4ක අනුපාතයක පවතී. ගනුදෙනුකරුවන් පැමිණීම පොයිසෝන් ව්‍යාප්තියක පිහිටයි නම්,

අ) ඕනෑම මිනිත්තුවක් තුළ ගනුදෙනුකරුවෙකු නොපැමිණීමේ සම්භාවිතාව

ආ) ඕනෑම මිනිත්තුවක් තුළ ගනුදෙනුකරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් පැමිණීමේ සම්භාවිතාව

ඇ) ඕනෑම තත්පර 30ක කාලයක් තුළ ගනුදෙනුකරුවෙකු හෝ ඊට වැඩි ගණනක් පැමිණීමේ සම්භාවිතාව

5. ගව පට්ටියකට දෙන ලද බෙහෙත් වර්ගයකින් සතෙකුට බෙහෙත් විෂ වීමේ සම්භාවිතාව 0.001කි. ගවයන් 2000ක් සිටී නම් හරියටම සතුන් දෙදෙනෙකුට බෙහෙත් විෂ වීමේ සම්භාවිතාව සොයන්න.

. කර්මාන්තශාලාවක නිපදවන භාණ්ඩයක නිෂ්පාදන කාල මධ්‍යන්‍යය තත්පර 90 හා විචලතාවය තත්පර 100 වන පරිදි ප්‍රමත ව්‍යාප්තියක පිහිටයි. ඒ අතුරින් අහඹු ලෙස තෝරා ගත් භාණ්ඩයක නිෂ්පාදන කාලය,

) අවම වශයෙන් තත්පර 105ක් වීමේ සම්භාවිතාව සොයන්න.

)) තත්පර 80 - 95 වීමේ සම්භාවිතාව සොයන්න.

) තත්පර 98ට අඩු වීමේ සම්භාවිතාව සොයන්න.



Scanned by TapScanner